# සිතිවිලි
# ගෙත්තම්

ජී. එච්. අනුසරා අභිෂේකනී රණවීර

# සිතිවිලි ගෙත්තම්

## ජී.එච්. අනුසරා අභිෂේකනී රණවීර

# සිතිවිලි ගෙත්තම්


## ජී.එච්. අනුසරා අභිෂේකනී රණවීර

### - කතෘ -


### පළමු දිගහැරීම

| | |
|---|---|
| පාසල | : මහ/ස්වර්ණමාලි බාලිකා විද්‍යාලය |
| ඉගෙනුම ලබන පන්තිය | : 9 ශ්‍රේණිය |
| කෘතිය පළ කරන දිනය | : 2024.11.22 |


**ISBN අංකය : 978-624-208-824-2**

# පිදුම

මෙම පොත සෑදීමට මා හට උපකාර කළ

මාගේ දෙමාපියන් ද

සහෝදර සහෝදරියන්ට ද

පන්හිඳට මා හුරු කළ

සිද්ධාර්ථ මහා විදුහලේ විදුහල්පති

ප්‍රමුඛ

ආචාර්ය මණ්ඩලයට

මෙම පොත පුදමු......!!



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරුදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ''හෙරණගත්කරණි'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


| | පිටු අංක |
|---|---|
| මගේ මවු බිම | 1 |
| අපේ උරුමයන් | 2 |
| පුස්තකාලය | 3 |
| පරිසරය | 4 |
| අද වෙසගේ බෝ සෙවණේ | 5 |
| බලන් කුඩතුරා හැර දෑසේ | 6 |
| මම කුමාරතුංග වෙමි | 7 |
| ගුරු මවුනි | 8 |
| මා කැමති පොත | 9 |
| වැස්ස | 10 |
| අහස පොළොව තැනිතලාව | 11 |
| අප්පච්චි | 12 |

# <u>මගේ මවු බිම</u>

මනහර කඳුවලින් වට වූ මගේ රට
මල් ගොමු, උයන් වතු හැම අත තිබෙන රට
සීතල රිදී දිය දහරා ගලන රට
කාටත් නොදෙවෙන සිරිලක් මගේ රට

පැරකුම් දුටුගැමුණු මහසෙන් රජුන් අපේ
පණමෙන් රැක්ක සැම විට රන්දීපේ අපේ
කැප්පැටිපොළ, පුරන් අප්පු හිටිය අපේ
රැකගමු අපිත් ඒ වීරයෝ හිටිය රටේ

ටිබෙටයෙ හිටපු මහින්ද හිමි පෑන අරන්
පෙරදා ගීත ලිව්වා සිත එඩිතරයෙන්
වැඩිහිටි ළමා කොයි කවුරුත් උනන්දුවෙන්
රැකි සේ වඩමු ආදරේ අපි හිතට අරන්

මව්බිමේ අපේ තිබූ සම්පත් කෑදරයෙන්
පරදේසෙන් සුද්දන් ආවානෙ ඉතින්
එනමුත් සිංහලයෝ රැක්කා රට පණමෙන්
මගේ පණ වුණත් දෙනවා මේ රටට උතුන්


ඉන්දිය සයුරෙ මුතු ඇටයයි මගේ රට
දිය ඇළි ගංගා පිරිලා ඇති මගේ රට
සැම දේ ඇති සුන්දර මගේ රට
රැකගම් සදාකල් ආදර මගේ රට

# අපේ උරුමයන්

අවුකනයයි සමාධියයි බුදු පිළිමයි
අනුරපුරේ රුවන්වැලිය කිරි පාටයි
පොළොන්නරුවේ ගල් විහාරෙ බුදු පිළිමයි
මේ හැම ලබපු සිරිලක් අපි පිංපාටයි

අනුරපුරේ සමාදියේ බුදු පිළිමයි
සීගිරියේ බිතු සිතුවම් අපෙ උරුමයි
අනුරපුරේ අභයගිරිය නිවන් මගයි
දිවිය ලෝකෙ පරදන රට ලංකාවයි

සුවාසුදහස් බුදු දම් දෙසු එදා
සෙංකඩගලේ වැජඹෙයි එලෙසින් සදා
අගනා දන්ත ධාතුන් වැඩ සිටින සදා
දළදා වරුණ කියනෙමි මුදුනත් වන්දා



# <u>පුස්තකාලය</u>

පොතක් කළණ මිතුරෙකි අප සැවොම හට
කදිම දැනුම් තෝතැන්නකි ළමුන් හට
ඉතින් පමා වනු ඇයි මේ සෑම විට
අවසර පුස්තකාලය ගැන කියන්නට

උගතුන්, පඬිවරුන්, වියතුන් බිහි වන්නේ
අඥානයින් හට නෑ මෙහ වැඩ දෙන්නේ
පොතේ අගය දන්නා අය මෙහි එන්නේ
පුස්තකාලේ අප හට සිතුමිණ වැන්නේ

පොත පත කියවලා දැනුමක් ලබා ගමු
හැකි සැම විටම පොත් කියවන තැනට යමු
පොත පත කියවලා දැනුමක් ලබා ගමු
ලෝභ නැතුව අන් අයටත් බෙදා දෙමු

නොදුටු නොවිරූ ලෝකෙට අපි පිය නගමු
පොතින් පතින් ඒකට ආදාර ගමු
හෙට ලොව දිනන දරුවන් අපි සැවොම වෙමු
නිහඬ මිතුරු පුස්තකාලයටම යමු

# පරිසරය

මී අඹ සුවඳ විහිදෙන වන ගොමු මැද්දේ
ලස්සන මලින් බරවුණු රුක්ගොමු මැද්දේ
බටිති මලිති ගී ගයනා හඩ මැද්දේ
ඉන්නට හිතට සතුටුයි මේ සිරි මැද්දේ

හිරු කුමරා කන්ද උඩින් එබී බලනවා
තුරු හිස් මුදුන් එළියෙන් රන් පැහැ වෙනවා
සිව් පා සතුන් සතුටින් වැඩ අරඹනවා
සොබා දහමෙ අසිරිය මින් කියැවෙනවා

හිරු එළියෙන් කන්දම නැහැවෙන අයුරු
මියුරු එලවලින් වනයම පිරෙනා අයුරු
මලිති බටිත්තන් ගී ගයනා අයුරු
සොබා දහම් මෑණිය දෙව් මැව් අයුරු


හුස්ම වැටෙන්නෙත් අපෙ ඔබ නිසාවෙනි
ජීවෙ ලැබෙන්නෙත් අපෙ ඔබ නිසාවෙනි
බඩ කට පිරෙන්නෙත් අපෙ ඔබ නිසාවෙනි
ඒ ඔබ නිසයි අපෙ පරිසර මෑණියනි

<u>අද වෙසගේ බෝ සෙවණේ</u>

අද වෙසගේ පෝ දිනේ
සුදු සඳ රැස් වැටී පෙනේ
බුදු සමිඳුගේ සිවුරු කොනේ
දැවටී යමු අපි නිවනේ

සිරිලක් තලය පිසදා එන මද නලට
බුදු රැස් ගලන වෙසගේ කිමිදෙන්ට
ආසිරි වැස්ස වසිනා විට පිහිනන්ට
දම් අම සයුරු තෙර වී ඔබ සැනසෙන්ට

සම්බුදු සිනාවෙන් මුලු රට ඔප වේවා
ලොව්තුරු දහම මුලු ලොවටම පැතිරේවා
තුන්සිත් පහන් කළ ලෝසත සැනසේවා
වෙසගේ ඔබට සිරි සුබ මඟුලක් වේවා



*''බලන් කුඩතුරා හැර දෑසේ'' පද්‍ය රචනා තරගාවලියේ*

*මා ප්‍රථම ස්ථානය දිනාගත් පද්‍ය පන්තිය*

හා හා හරි හාවා නැතේ
එදා කැලේ හාවා නැතේ
පුංචි අයගේ සද්දේ නැතේ
දුරකථනය අතේ ඇතේ

පුංචි ළමයි මල් වාගේ
සමනලයින් කතා වගේ
කුරුළු පැටව් ඒ වාගේ
ළමයින් හට එපා වගේ

ගොඩක් ගීත ලියනා විට
හැම විට ඔවදන් දෙන්නට
ඔබේ හඬින් ගැයෙනා විට
කනට අමා මී පැණි මට

අම්මා අතේ නාද කරන
තාත්තා අතේ නාද කරන
ගෙදර නිතර නාද කරන
සැම වනසයි දුරකථන

මුතු වාගේ දත් දෙපළයි
එහෙ මෙහෙ යන දෙනෙත් දෙකයි
ලස්සන පොඩි කතා වැලයි
පුංචි ළමෝ මිණි පරදයි

හොඳ පුරවැසියන් කරන්ට
මිණි මුතු නෑ මට දෙන්නට
කුමරතුංග ලෙසින් ඔබට
දෙන්නෙමි ඔවදන් හැමවිට

## මම කුමාරතුංග වෙමි

හත්පණ පොත මම ලිව්වා
හීන් සැරෙත් මම ලිව්වා
මඟුල් කෑම මම ලිව්වා
පුංචි ඔබට පොත් ලිව්වා

හත් පණ හරි විහිළු කතා
පොඩි ළමුන්ට සිනා ගෙනා
කිරි හාමිත් හරිම කෙනා
ලොකු පොඩි හැම හිනාවෙනා

කුමර ගීතයයි
කියවන නුවණයි
මේ සැම ඔබටයි
සතුට බෙදා දෙයි



# ගුරු මවුනි

අකුරු කියා දුන්නා මට
සිරිත් කියා දුන්නා මට
දෙවනි අම්මා වී මෙලෙසට
උදව් කළා ලොව දිනන්ට

අහසේ තරුපති නුඹ වේ
සඳවට තරුවැල් අපි වේ
දෙවනි මවක් ලෙසින්ම වේ
ශිල්ප සතර සැම පෙව්වේ

මවක් වගේ සෙනෙහස දී
පියෙක් වගේ අප රැක දී
පුංචි අපට ආදරෙ දී
දියුණුවෙ මග කියා දිදී

හොඳ නරක ද කියා දෙමින්
හරි මග පෙන්නලා දෙමින්
නැණයෙන් පෝෂණ කරමින්
වදිනෙමි හද මල බැතියෙන්




# මා කැමති පොත



මඩොල් දූවෙ රස කතා
ගත්කරු මාර්ටින් ලියා
පුංචි අපව පිනවලා
අප හට පොත් සාදලා

චරිත දෙකක් මෙහි ඇතා
කවට කමින් ඉතිරිලා
පින්නාගේ දඟ වැඩා
උපාලි ඒකට හොඳා

මිතුරු කමින් වැඩ කළා
සමඟි බලේ ළග ඇතා
දූපතකට ගිහිල්ලා
කල් ගෙව්වා සැම දිනා



# වැස්ස

නිරිත දිග සුළං දසතින් හමන්නේ
ගස් වැල් ගල් හැම උදුරා දමන්නේ
නාය යෑම් ගංවතුර ද ගලන්නේ
වැසි කාලෙට මේ හැමදෙය පෙනෙන්නේ

පුංචි දිය බිඳෙන් මුළු වෙල් උතුරන්නේ
ඇළ දොළ පිරී ගංගා ඉතිරී යන්නේ
දණ්ඩි පැටව් එහෙ මෙහෙ උඩ පනින්නේ
පුංචි ළමෝ හරි සතුටෙන් බලන්නේ



# අහස පොළොව තැනිතලාව



රෑ අහසේ රන් පාටින් දිලසෙන්නේ
පුංචි පුංචි මල් වාගේ පෙනෙන්නේ
අදුර මැවෙන්නේ එළියක් වැටෙන්නේ
තරු කුමරියෝ අහස පුරා සිටින්නේ

තරු වැල් අහසේ පිරිලා
පොළොවේ සඳ රැස් වැටිලා
රෑ කුමරියො මල් පිපිලා
මේ රැය සුන්දර වීලා

තණ උඩ ඇති පිනි බිංදුයි
දසත හමන සුළං රැළයි
හැමතැන ඇති මල් සුවඳයි
රාත්‍රියම හරි සොදුරුයි

ගඟ අද්දර ගස නාමල්
පොකුරු පිපී හැම අත මල්
සුවඳ හමයි ජලයේ නිල්
මුළු පරිසරයම වී මනකල්

මී මැස්සගෙ ගුමු ගුමුවයි
බට්ටිච්චගේ කිචි බිචියයි
පොඩි ළමුන්ගේ සිනා හඬයි
මේ හැම දෙන සතුට ගෙනෙයි



# අප්පච්චි

ඔබේ කුසේ නොවැදුවත් අපව

වටිනවා ඔබව අම්මා තරමට

අප හට කිරි නොපෙව්වාට

අපව ආදරෙන් හැදූ

අඩන විටදි අප සැනසූ

අප කුසගින්නේ නොතබා

ඔබ කුසගින්නේ සිටියා

අපේ පිටුපස යෝධ සෙවනැල්ල

මගේ ජීවිතය නගා සිටුවන්න

මගේ ලෝකේ හදක් වූ

මගේ ආදර අප්පච්චි



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක  සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN අංකය : 978-624-208-824-2